# අටමස්ථානාධිපති ධූරය හා පූජ්‍ය පාද පල්ලේගම හේමරතන නායකහිමි

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සාලිය කුලරත්න
සිංහල අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ක්‍රි.ව. 1153 දී පොළොන්නරුවේ පාලන කාර්යය ඇරඹූ පලමු පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රාකත්වය යටතේ ශාසන සංශෝධනයක් සිදු වූ අතර, එය ඒ වන විට පැවැති පිරිහිගිය සංඝ ශාසනයට සිදු වූ ප්‍රබල පිටුවහලද විය. මහා වංශයේ දැක්වෙන පරිදි ඒ වන විට ගම්මාන වල පිහිටි කුඩා වෙහෙර විහාර ස්ථාන වල වැඩ විසූ භික්ෂූහු යන්තම් ආගමික සංස්කාර කරමින් අඹුදරුවන් පවා පෝෂණය කළහ. ශාසන සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ කතිකාව පොළොන්නරුව ගල්විහාරය ඉදිරියේ ඇති සෙල් පුවරුවක සටහන්වීමද සිදුවිණි. කෙසේ හෝ එයින් පසු අග්‍ර සංඝනායක හිමි හෙවත් මහාසාමි නාහිමි නමින් වූ ධුරයක් ස්ථාපිතවූයේය. ඒ වන විට නිකාය වශයෙන් වූ භේදය තාවකාලිකව නතරවුවද අෂ්ඨමූල නම් සංඝගුරු කුල සම්මතය පැවැතිණි. අෂ්ඨමූළ යනු සංඝයාවහන්සේලාගේ ගුරු කුල වශයෙන් පැවැති උත්තරමූල ආදී ආයතන අටකි. එතැන් සිට ගිහි රාජ්‍යයේ නායකයා වූ රජුත් පැවිදි රාජ්‍ය හෙවත් ශාසනයේ නායකයා වූ අග්‍ර සංඝනායකවරයාත් අතර, සමීප සබඳකමක් ගොඩ නැගුණි. ඉන් පසු යුගයේ සාසනය හා භික්ෂූන් වහන්සේලා පිළිබඳ තවත් වෙනස්වීම් රැසක් සිදුවුවද අටමස්ථානාධිපති ධූරයේ ආදි අවස්ථාව ලෙස ඉහත දැක්වූ පදවි ස්ථාපනය සැලකිය හැකි විණි.

වර්ෂ 2023.01.28 වන දින ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ අතින් මහා බෝමලුවේදී අක්තපත්‍ර පිළිගන්වනු ලැබීමෙන් අභිනව අටමස්ථානාධිපති පදවිය ලැබූ අතිපූජ්‍ය පල්ලේගම හේමරතන ස්වාමීන් වහන්සේගේ විශුද්ධ හා ශාසනමාමක චරිතයත් උන් වහන්සේ ස්ථානගතව සිටි සුවිසල් ආගමික සංස්කෘතික පසුතලයත් අළලා මේ මෑතක ''හේමාවලෝකන'' නමින් විසල් ග්‍රන්ථයක් මුද්‍රණ ද්වාරයෙන් නිකුත්විණි. මෙම ග්‍රන්ථය ආචාර්ය පූජ්‍ය කල්ලන්චියේ රතනසිරි හිමියන්ගේ සහ රජරට විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අජිත් තල්වත්තගේ සංස්කරණයකි. අටමස්ථානාධිපතින් වහන්සේ නමක් උදෙසා විවිධ විෂය තතු එක්තැන් කරමින් නොයෙක් විද්වතුන්ගේ දායකකාරත්වයෙන් මෙවැනි ශාස්ත්‍ර සංග්‍රහයක් සිදුවූ පළමු අවස්ථාවද මෙය විය හැකිය. මෙම ග්‍රන්ථයට ශ්‍රීමහා බෝධිය, අටමස්ථානයට අයත් විවිධ ස්මාරක පුරාවිද්‍යාවේ නවතම පර්යේෂණ, සමාජ සංස්කෘතිය, වාස්තු විද්‍යාව, භාෂා සාහිත්‍යය හා සංනිවේදනය ආදි විෂය පසුබිම් රාශියක් නියෝජනය කළ ලිපි 47 ක් අඩංගු වේ. ඒ ලිපි රාශිය අතර අභිනව අටමස්ථානාධිපති අතිගරු පූජ්‍ය පල්ලේගම හේමරතන නායක ස්වාමින් වහන්සේගේ ජීවන චරිතය සහ උන් වහන්සේගේ

ශාසනික මෙහෙවර අඩංගු ලිපි කිහිපයකින්ද එය සමන්විතය. පූජ්‍යපාද පල්ලේගම හේමරතන ස්වාමින් වහන්සේ පුරා වසර 10 ක් තිස්සේ ශ්‍රී මහා බෝධියේ උඩ මළුවේ තේවාව භාරව කළ වැදගත් කාර්යය ඒ හැම ලිපියකම වෙසෙසින් අවධාරණයට ලක් වී තිබිණි. එසේම 1969 න් පසු උන් වහන්සේ ගීත රචකයෙකු වශයෙන් සිංහල ගීත වංශයේ පතාපවත් ලෙස ස්ථානගත වූ අන්දමද ඒ ලිපිවල සටහන් වෙනි. ප්‍රේමකීර්තිද අල්විස්, ස්වර්ණ ශ්‍රී බණ්ඩාර වැනි ප්‍රවීණ රචකයන්ගේ ඇසුරද උන් වහන්සේට නිතැතින් හිමි වූ දුර්ලභ අවස්ථා වූයේය.




පෙරද සඳහන් කළ පරිදි දේශපාලන ආයතනයේ ප්‍රධානියා සහ අටමස්ථානාධිපතින් වහන්සේගේ ධූරය අතර ඓතිහාසික සුවදතාවක් පැවති නමුත් පල්ලේගම හේමරතන නායක ස්වාමින් වහන්සේගේ අල්පේච්ඡ ඇවතුම් පැවතුම් හා ස්වාධීනත්වය හේතුවෙන් රාජ්‍යයේ අධිකාරි ලක්ෂණ වලට නතු නොවීම උන් වහන්සේගේ විශේෂත්වය විය. මින් පෙර අටමස්ථානාධිපති ධූරය දැරූ පූජ්‍ය පල්ලේගම සිරිනිවාස ස්වාමින් වහන්සේගේ අපවත්වීම පිළිබඳ උළෙලටද අනවශ්‍යය රාජානුග්‍රහයක් ලැබීම වැළැක්වීමට කටයුතු කිරීමෙන්ද උන් වහන්සේගේ ඉහත කී ගුණය ස්ඵුට වේ. හේමාවලෝකන නමින් රසැයුණු මෙම ශාස්ත්‍රීය සංග්‍රහය පුරාවිද්‍යාව, ඉතිහාසය, සාහිත්‍යය ආදි විෂයයන් හදාරණ විද්‍යාර්ථීන්ගේ නොමද ප්‍රයෝජනයට හේතුවන ශාස්ත්‍රිය කෘතියක් බව සඳහන් කළ මනාය.